# නොවටින්නේ කුහක වත ය

කපිල පීරිස් මහතා තම මක්තෝබර 14 වැනි දින ලිපිය අවසන් කරන්නේ මා ගැන බොරු වර්ණනාවක් කරමිනි. ඔහු මෙසේ කියයි. “මා එතුමා ගෙන් විශාල දෙයක් ඉගෙනගෙන ඇත. එවැනි පසුබිමක් තුළ සහ අපේ සම්ප්‍රදාය තුළ එතුමනට ‘ටොකු’ ඇනීමට මට කිසිදු අවශ්‍යතාවක් පැන නො නගී. එපමණක් නො ව මා හට එය කිරීමට ද නොහැකි ය. ටොකු ඇනීම, වාද කර ජය ගැනීම/පරාජය වීම ආදිය මේ අදහස් දැක්වීමේ දී මුළුමනින් ම බැහැර කරමි. රටට ජාතියට විශාල මෙහෙයක් කළ, එසේ ම අප ද බටහිර චින්තනයෙන් මුදා ගත් ගුරුවරයකු සම්බන්ධයෙන් එවැනි සංකල්පයක් වත් තිබිය හැකි නො වේ. හුදු තර්කය මෙහි දී අපට වැදගත් නැත.”

කපිල පිරිස් මහතා මේ ලිපිවලින් කරන්නේ හුදු අදහස් දැක්වීමක් නො වේ. ඔහු තර්ක කරයි. මා ගෙනෙන තර්ක ඛණ්ඩනය කිරීමට උත්සාහ කරයි. ඔහුට අවශ්‍ය වූයේ අදහස් දැක්වීමට පමණක් නම් ඔහු මා සමග විවාදාත්මක ලිපි හුවමාරුවකට නො එළඹිය යුතු ය. ඔහුගේ අදහස දක්වා වාද කිරීමෙන් වැළකී සිටීමට ඔහුට හැකියාව තිබුණි. තම අදහස ප්‍රකාශ කිරීමෙන් පසු ඔහු කළ යුතුව තිබිණි යම්කිසි අයුරකින් මා ඔහුගේ අදහස් විකෘති කෙළේ නම් ඒ නිවැරදි කිරීම පමණකි. එහෙත් ඔහුගේ අදහස් විවේචනය කරන විට ඔහු තර්කයෙන් ඒ විවේචන බිඳ හෙළීමට උත්සාහ කරයි. මම තර්ක කරන බව විවාද කරන බව පිළිගනිමි. (තර්කය දෙපැත්ත කැපෙන අවියකි තර්කයෙන් යමක් දැනගත නොහැකි ය ආදිය මම ප්‍රතික්ෂේප කරමි. තර්ක කිරීමෙන් නිවන් අවබෝධ කරගැනීමට නො හැකි ය. එහෙත් අප මේ කතාකරන්නේ නිවන් අවබෝධ කරගන්නේ කෙසේ ද, ඒ සඳහා වූ මාර්ගය කුමක් ද ආදිය ගැන නොව වැව් දාගැබ් ගැන ය. අනෙක් අතට ලෞකික කරුණුවලදී අනුමානය බුදුදහමෙන් ප්‍රතික්ෂේප නො වේ.) තර්ක කිරීමෙන් ද විවාද කිරීමෙන් ද අදහස් දැක්වීමක් වන බව පැහැදිලි ය. එහෙත් ඒ හුදු අදහස් දැක්වීමක් නො වෙයි. කපිල පීරිස් මහතා කරන්නේ උගුරට හොරා බෙිත් කෑමකි. තමා කරන දේ පිළිගැනීමට අකමැති අයකුගේ වචන හරඹයකි. ඔහු අනුගමනය කරන්නේ කුහක වතකි. තර්ක කරමින් තර්ක නොකරන බව කියන ඔහු ටොකු අනින්නේ නැතැයි කියමින් හීං ටොකු අනියි.. ඔහු ඔළුව අත ගගා අනේ මේ මගේ ගුරුවරයකු නො වේදැයි අසමින් හීං ටොකු අනියි. අපේ සම්ප්‍රදායේ ගුරුවරුන්ට මුසිලයන් වූ ගෝලයෝ ද සිටියහ. කපිල පීරිස් මහතා මගේ ශිෂ්‍යයකු බව පිළිගනිමින් ඒ මුසිල සම්ප්‍රදායෙහි වෙයි. ඒ ඔහු හා සම්බන්ධයෙනි. මගේ පැත්තෙන් ගත් කල ඔහු මගේ ශිෂ්‍යයකු ලෙස මම නො පිළිගනිමි. ඔහු ඇතැම් විට ඩි ඇල් ඕ මැන්දිස් මහතාගේ ගෝලයකු විය හැකි ය. එහෙත් මගේ නම් ශිෂ්‍යයෙක් නො වේ.

කපිල පීරිස් මහතා මෙසේ ද කියයි. “දාගැබ්වල වටිනාකම ඇත්තේ ඒවා නූතන ඉංජිනේරුවන් නිව්ටන්ට අනුව ඒවායේ තාක්ෂණයන් විග්‍රහ කළ නිසා නොවන බව අවිවාදිත ය. අප එසේ නො වේ යැයි කොතැනකවත් සඳහන් කර නැත.” වටිනාකම යන වචනය ඔහු යොදාගත් බවක් මම ද නො කීවෙමි. එහෙත් ඔහු වැදගත්කම යන වචනය යොදා ගත්තේ ය. මේ සියල්ල නැවත නැවත මතක්කිරීමට සිදුවීම ගැන කණගාටුවෙමි. එහෙත් කපිල පීරිස් මහතා පීළි පැන නිදොස්වීමට කරන උත්සාහය හෙළිදරව් කළ යුතු ය. ඔහු කිහිප වතාවක්ම තම ලිපිවල මෙවැනි ප්‍රකාශ කරයි. “අද මේවා මෙපමණින් හෝ රැඳී ඇත්තේ අද ඉතා ප්‍රචලිත ව ඇති මෙම නිව්ටෝනීය සංදර්භය තුළින් ම මේවායේ වැදගත්කම පෙන්වා ලූ නිසා ය.” (සැප්තැම්බර 23). එසේ දාගැබ්වල ද වැදගත්කම නිව්ටෝනීය සන්දර්භය තුළින් පෙන්වා දීම නිසා ඒ ආරක්ෂා වූ බව කී කපිල පීරිස් මහතා ඔක්තෝබර 14 වැනි දා වන විට මේවා යන්නෙන් දාගැබ් ඉවත් කරයි. එහෙත් එසේ කිරීමේ දී ඔහු තව තවත් පරස්පරවල හිරවෙයි. ඔහු මෙසේ කියයි.“ දාගැබ් පිළිබඳ කතාව මීට මඳක් වෙනස් ය. වැව්වලට (විශේෂයෙන් කුඩා) වඩා මිනිස්සු දාගැබ් ආරක්ෂා කරගැනීමට පෙළඹෙති. කුඩා වැව් කඩා දමා විශාල බැම් බැඳ විශාල ජලාශ තැනීමට යෝජනා වුවහොත් අද ගැමියන් එතරම් විරුද්ධ වන්නේ නැත. මේ කුඩා වැව්වල වැදගත්කම අද සියල්ලන්ට ම පාහේ පෙන්වා දිය හැක්කේ නිව්ටෝනීය සන්දර්භය තුළ එහෙත් පැරණි ඉංජිනේරු සම්ප්‍රදායේ පදනමේ සිට ය.”

ඔහු මේ කියන්නේ මෙසේ ද ප්‍රකාශ කිරීමෙන් පසුව ය. “අප අප ගේ ඉංජිනේරු සම්ප්‍රදාය ලිපි මගින් පෙන්වා දීමට උත්සාහ ගත්තේ එම ඉංජිනේරු සම්ප්‍රදායේ ඇති හුදු භෞතික (ඇඟට දැනෙන) ක්ෂෙත්‍රයන්ට ඇති සංසිද්ධීන් නූතන නිව්ටෝනීය සන්දර්භය තුළ විස්තර කර වර්තමාන අදාළ බලධාරීන්ට (සහ සමාජයට) ඒ පෙන්වා දීම වැදගත් වන බව ය. වර්තමාන බලධාරීන් ද අපේ පැරණි ගැමි සම්ප්‍රදායේ උදව්ය නම් අපගේ උත්සාහය තේරුමක් නැත .. .. .. වර්තමානයේ විශේෂයෙන් ඊනියා සංවර්ධන වැඩ කටයුතු සිදු වන්නේ ගැමියන් ගේ වුවමනා එපාකම් මත නො වේ

© Prof. Nalin De Silva

(ඇත්තට ම වර්තමානයේ සංවර්ධනය ආදිය පිළිබඳ ගැමියන් ගේ අදහස් මතිමතාන්තර අපේ සම්ප්‍රදායට බොහෝ විට එකඟ ද නැත.) අපේ ඉපැරණි වැව් පද්ධති රැක ගැනීමට ගැමියනට කෙතරම් වුවමනා වුව ද, අද ඒවා ඔය තරමින් හෝ රැකී ඇත්තේ එම වුවමනාව නිසා නම් නො වේ. එම ගැමියන් ගේ වුවමනාව සහ ඔවුන් ගේ සාම්ප්‍රදායික දැනුම ද උකහාගෙන ඩී ඇල් ඕ මැන්දිස් වැනි මහතුන් විසින් ඒවා නූතන නිව්ටෝනීය සන්දර්භය තුළ අදාළ බලධාරීන්ට අතිශය ප්‍රබල එනම් ඒවායේ තාක්ෂණික පසුබිම සහිතව පෙන්වා ලූ නිසා ය.”

ඔහුගේ තර්කය (අදහස් දැක්වීම)ට අනුව මිනිස්සු විශේෂයෙන් කුඩා වැව්වලට වඩා දාගැබ් ආරක්ෂා කරගැනීමට පෙළඹෙති. අද ගැමියෝ කුඩා වැව් කඩා බිඳ ලොකු වැව් තැනීමට එතරම් විරුද්ධ නො වෙති. වර්තමානයේ සංවර්ධනය පිළිබඳ ගැමියන්ගේ මතිමතාන්තර අපේ සම්ප්‍රදාය සමග බොහෝ විට එකඟ වන්නේ ද නැත. මේ සියල්ලෙන් ඔහු කියන්නේ අද ගැමියන් බොහෝ විට අපේ සම්ප්‍රදාය සමග එකඟ නොවන බව ය. අපේ පැරණි ගැමි සම්ප්‍රදායෙහි නොමැති නිලධාරීන්ට කපිල පීරිස් මහතා නිව්ටෝනීය සන්දර්භයෙහි වැව් තේරුම් කරන්නේ ඔවුන් පැරණි සම්ප්‍රදායෙහි විණි නම් ඒ උත්සාහය නිරර්ථක වුවක් බව කියමිනි. කපිල පීරිස් මහතාට ප්‍රශ්නය වන්නේ නිලධාරීන් අපේ සම්ප්‍රදායෙහි නැති වීම ය; එමෙන් ම බොහෝ දුරට ගැමියන් ද එහි නැති වීම ය. අප කලින් ද සඳහන් කර ඇති පරිදි එලෙස අපේ සම්ප්‍රදායෙහි නැති අයට නිව්ටෝනීය සංකල්ප ඔස්සේ ඒ වැව්වල (හා දාගැබ්වල) වැදගත්කම තේරුම් කර දීමට යෑම පනින රිළවුන්ට ඉණිමං බැඳීමකි, පැන යන මුවන් හමුවේ නෙළු පළා දැමීමකි.

අද ගැමියන්ට යම් වුවමනාවක් තිබුණත් වැව් රැකගැනීමට නොහැකි යැයි කියන කපිල පීරිස් මහතා වැව් රැකුණේ ඩී ඇල් ඕ මැන්දිස් මහතා වැන්නවුන් අදාළ නිලධාරීන්ට නිව්ටෝනීය සන්දර්භය තුළ  ඒ රැක ගැනීමේ වුවමනාව පෙන්වා දීම නිසා යැයි කියයි. මෙහි දී කපිල පීරිස් මහතා අද ගැමියන් ගැන කියන දේ පැරණි ගැමියන් සම්බන්ධයෙන් අදාළ නොවන්නේ යැයි ඒ මහතා වුව ද පිළිගන්නේ යැයි සිතමි. පැරණි ගැමියෝ බටහිර අධ්‍යාපනයෙන් හා (විකෘත) නිව්ටෝනීය සංකල්පවලින් ඔළුව අවුල් කර නොගත්තෝ වූහ. ඔවුන්ට, එනම් පැරණි ගැමියන්ට වැව් ආරක්ෂා කරගැනීමේ වුවමනාව ඉංගිරිසි පාලන සමයෙහි ද තිබෙන්නට ඇතැයි උපකල්පනය කිරීම වරදක් නො වේ. එහෙත් ඔවුන්ට එදා ඒ සඳහා අවශ්‍ය පරිපාලන දේශපාලන බලය නො තිබිණි. ඒ දේශපාලන හා පරිපාලන බලය ලබාගැනීමට ඔවුන්ට උපකාරි වූයේ ඩී එස් සේනානායක හා පසු කලෙක සී පී ද සිල්වා ආදී මහත්වරුන් ය.

බ්‍රිතානීන් අපේ වැව් පද්ධතිය කඩා බිඳ දැම්මේ, ඒ ඔස්සේ මහා මාර්ග තැනුවේ අපේ ආර්ථිකය කඩා බිඳ දැමීමට මිස ඒ වැව් නිව්ටෝනීය සංකල්පවලින් තේරුම් ගත හැකි ද නැත් ද යන්න සලකා බලා නො වේ. එදා සුද්ද ඉංජිනේරුවකු ඉදිරිපත් වී නිව්ටෝනීය සන්දර්භයෙහි වැව්වල වැදගත්කම තේරුම් කර දුන්න ද සුද්ද පාලකයන් වැව් කඩා දමනු ඇත. පසුව වැව් ප්‍රතිසංස්කරණයට මුල් වූයේ ද ඒ ආර්ථික වුවමනාව ය. මෙරට කෘෂි ආර්ථිකය නගා සිටුවීමේ වුවමනාව තිබූ දේශපාලනඥයෝ වැව් ප්‍රතිසංස්කරණයට මුල් වූහ. වැව් ප්‍රතිසංස්කරණය ආරම්භ වූයේ නිශ්චිතව කවරදාදැයි කීමට මම නො දනිමි. එහෙත් ඒ ඩී ඇල් ඕ මැන්දිස් මහතා ඉංජිනේරුවකු ලෙස ඉංජිනේරුවන් අතර යම් “වැදගත්කමක්” ලබාගෙන නිව්ටෝනීය සංකල්පවලින් වැව්වල වැදගත්කම තේරුම්ගැනීමට පෙර බව නම් කිව හැකි ය. ඩි එල් ඕ මැන්දිස් මහතා ඉංජිනේරුවකු වූ පමණින් ඔහුට අනෙක් ඉංජිනේරුවෝ සවන් දුන්හ යැයි සිතීමට නො හැකි ය. අනෙක් අය ඔහුට සවන්දෙන්නට ඇත්තේ ඔහු ඉංජිනේරු වෘත්තියෙහි යම් වැදගත්කමක් ලබාගැනීමෙන් පසුව විය යුතු ය. එහෙත් ඒ කාලය වන විට මෙරට යම් මට්ටමකින් වුව ද වැව් ප්‍රතිසංස්කරණය ඇරඹී තිබුණාට සැකයක් තිබිය නො හැකි ය.

එයට හේතුව පෙර සිටි ඩී එල් ඕ මැන්දිස් කෙනකු යැයි කපිල පීරිස් මහතාට කිව හැකි ය. එහෙත් ඩී එස් සේනානායක මහතා හෝ වෙනත් දේශපාලනඥයකු හෝ වැව් ප්‍රතිසංස්කරණය කිරීමට තීරණය කෙළේ එවැනි ඉංජිනේරුවකුගේ නිව්ටෝනීය සංකල්පවලින් වැව්වල වැදගත්කම පෙන්නීම නිසා යැයි විශ්වාස කිරීමට නො හැකි ය. ආර්ථික අවශ්‍යතාව එහි දී වැදගත් සාධකය වූවා නිසැක ය. නිව්ටෝනීය සන්දර්භයේ අවශ්‍යතාව වැව් ප්‍රතිසංස්කරණය කිරීම නොව වැව් නැති කිරීම ය. අද ඒ කාර්යය බ්‍රිතානි අධිරාජ්‍යවාදයේ මුල් යුගයටත් වඩා එහාට ගොස් ඇතැයි සිතමි. නිව්ටෝනීය සන්දර්භය යනු නිව්ටෝනීය යාන්ත්‍රිකය පමණක් නො වේ. මා කලින් සඳහන්කර ඇති ආකාරයට පුරා විද්‍යාඥයෝ ද නිව්ටෝනීය සන්දර්භයෙහි ක්‍රියාත්මක වෙති. ඇතැම් දේශපාලනඥයෝ ද ඒ සන්දර්භයෙහි ක්‍රියාත්මක වෙති. මෙරට ප්‍රධාන විපක්ෂ දේශපාලඥයකු පසුගිය දා වැව් ගොඩකිරීමට කතා කෙළේ නිව්ටෝනීය සංකල්පවල

© Prof. Nalin De Silva

ආධාරයෙන් නොවුවත් නිව්ටෝනීය සන්දර්භයෙහි ය. ඔහු නිව්ටෝනීය සංකල්ප නොදන්නකු හෝ වැවේ වැදගත්කම නිව්ටෝනීය සංකල්පවලින් තේරුම්කරන බව නොදන්නකු හෝ නොවිය හැකි ය. ඔහු බලයේ සිටියේ නම් ඩී එල් ඕ මැන්දිස් මහතාට හෝ කපිල පීරිස් මහතාට හෝ නිව්ටෝනීය යාන්ත්‍රිකයෙන් කෙතරම් හොඳින් වැව්වල වැදගත්කම තේරුම් කළත් වැව් පද්ධතිය ආරක්ෂා කරගැනීමට නොහැකි වනු ඇත. මෙරට වැව් පද්ධතිය මෙතරමින් වුවත් ආරක්ෂා වී ඇත්තේ පැරණි ගැමියන්ට තිබූ වුවමනාවට පසුගිය සියවසේ මුල්භාගයේ දේශපාලන නායකත්වයක් ලැබීම නිසා ය.

නිව්ටෝනීය සංකල්පවලින් වැව්වල වැදගත්කම තේරුම් ගැනීම යනු නිව්ටෝනීය සන්දර්භයට තවත් ආධිපත්‍යයක් ලබාදීම පමණකි. ඒ කෙළවර වනු ඇත්තේ වැව් ගොඩකර විනාශකිරීමෙනි. කපිල පීරිස් මහතා නිව්ටෝනීය සංකල්පවලින් වැදගත්කම් තේරුම් ගන්නේ එක් පැත්තකින් සමස්ත නිව්ටෝනීය සන්දර්භයෙන් (සුසමාදර්ශයෙන්) නිව්ටෝනීය යාන්ත්‍රිකයෙහි සංකල්ප වෙන්කර ගත හැකි යැයි උපකල්පනය කිරීමෙනි. වෙන්කිරීම බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි එක් ගුණයක් (Property) වුවත් ඒ දැනුම් සියල්ල ග්‍රීක යුදෙව් ක්‍රිස්තියානි චින්තනයෙන් බැඳී ඇත. නිව්ටන්ගෙන් දෙවියන් වහන්සේ හා ඊනියා යථාර්ථය අයින්කර නිව්ටන් අපේ මෙහෙකරුවකු කරගැනීම පිළිබඳ කපිල පීරිස් මහතා කරන්නේ හුදු පාරම් බෑමක් පමණකි. අද නිව්ටෝනීය සන්දර්භයෙහි යථාර්ථය අයින්කිරීමට කපිල පීරිස් මහතා කතාකරන්නේ ඔහුගේ බ්‍රෝහියර් - මැන්දිස් ව්‍යාපෘතිය යුක්තියුක්ත කිරීම සඳහා පමණකි. නිව්ටෝනීය සංකල්පවලින් වැවේ වැදගත්කම තේරුම් කිරීමේ දී නිව්ටෝනීය සංකල්පවල වැදගත්කම වැඩි වී ඒ ඉංජිනේරුවන් අතර පමණක් නොව පුරාවිද්‍යාඥයන් හා ගැමියන් අතරත් තව තවත් ඊනියා යථාර්ථයක් බවට පත්වීම වැළැක්විය නො හැකි ය. නිව්ටෝනීය සන්දර්භයෙන් එහි කොටස් අයින් කිරීමට කපිල පීරිස් මහතා කතාකරන්නේ ද වෙන්කිරීම ආත්මය කරගත් බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ය. කපිල පීරිස් මහතා තවමත් වෘත්තීය මට්ටමෙන් වැඩ කරන්නේ බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි ය. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයෙහි දැනුම් අපේ චින්තනයට අවශෝෂණය කිරීම එකකි. කපිල පීරිස් මහතාට හෝ වෙනත් ඉංජිනේරුවකුට හෝ ඉංජිනේරු තාක්ෂණයෙහි තවමත් ඒ කළ හැකි යැයි සිතිය නො හැකි ය. ඇතැම්විට අනාගතයෙහි දී ඒ කිරීමට හැකි අය ඉංජිනේරු ක්ෂේත්‍රයෙහි බිහිවනු ඇත. බටහිර ක්‍රිස්තියානි නූතනත්වයේ දැනුම් ඊනියා යථාර්ථය නොමැතිව යොදාගන්නේ යැයි මිථ්‍යා කතා පැතිරවීම තවත් එකකි. කපිල පීරිස් මහතා කරන්නේ දෙවැන්න ය. ඒ අපේ දැනුමට කරන ද්‍රෝහි කමක් මිස අන් කිසිවක් නො වේ. මෙහි දී කිවයුත්තක් වේ. මා දෙමළ ජාතිවාදයට එරෙහිව සංකල්ප ප්‍රවාද ආදිය නිර්මාණය කෙළේ ඊනියා බලධාරීන්ට, ඔවුන් කවරකු වුවත්, සිංහලත්වයේ වැදගත්කමක් එත්තුගැන්වීමට නම් නො වේ. මේ පිළිබඳ ව හා ඊනියා ගැමි බසින් ඇතැම් දේ විස්තර කිරීම ගැන පසුව සාකච්ඡා කරමු.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva